අධ්‍යාපන අමාත්‍යාංශය

ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ
සහ සංවර්ධන මධ්‍යස්ථානය

# රියදුරු තනතුරු සඳහා බඳවා ගැනීම

අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ පවතින දිවයිනේ ප්‍රමුඛතම ඉංජිනේරු පර්යේෂණ සහ සංවර්ධන ආයතනය වන ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය, ජාතික අවශ්‍යතා මත පදනම්ව ඉංජිනේරු පර්යේෂණ හා සංවර්ධන ව්‍යාප්‍රතින් මෙන්ම කර්මාන්ත සඳහා සේවා සැපයීමද සිදුකරනු ලැබේ.

ආයතනයේ නිල රථ ධාවනය, කාර්යාල නිලධාරීන් ප්‍රවාහනය, විවිධ ප්‍රදේශවල සිදුකරන ව්‍යාප්‍රති කටයුතු සඳහා නිලධාරීන් සහ භාණ්ඩ ප්‍රවාහනය ආදී සේවාවන් සඳහා දැනට පුරප්පාඩුව පවතින රියදුරු තනතුරු සඳහා මාස 3 ක කාලයක් කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීමට පහත සඳහන් සුදුසුකම් ලත් ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

**අධ්‍යාපන සුදුසුකම්:-** විෂයන් 02 කට සම්මාන සාමාර්ථ සමග විෂයන් 6 ක් සහිතව අ.පො.ස. (සා/පෙළ) විභාගය දෙවරකට නොවැඩි වාර ගණනකදී සමත්වීම.

**වෘත්තීය සුදුසුකම්:-** වලංගු බර වාහන රියදුරු බලපත්‍රයක් ලබා තිබීම සහ රියදුරු බලපත්‍රය ලබාගැනීමෙන් පසුව පිළිගත් ආයතනයක වසර 3 කට නොඅඩු රියදුරු පළපුරුද්ද.

**වයස් සීමාව:-** අවුරුදු 18-45 අතර

**වෙනත් සුදුසුකම්:-** කොළඹ හෝ ඊට ආසන්න ප්‍රධාන නගර වල පදිංචි, දවසේ ඕනෑම වේලාවක සේවය කිරීමට හැකියාව සහිත අයදුම් කරුවන් හට ප්‍රමුඛතාවය හිමිවෙයි.

**වැටුප:-** රු. 26,290/-

**අනෙකුත් ප්‍රතිලාභ:-**

- රු.17,800/- ක වියදම් දීමනාව සහ රු.5000/- ක විශේෂ දීමනාව.
- **සේවක අර්ථසාධක** අරමුදල සඳහා 15% ක ආයතනයේ දායකත්වය සහ 10% ක සේවකයාගේ දායකත්වය.
- සේවා නියුක්තියන්ගේ භාර අරමුදල සඳහා 3% ක ආයතනයේ දායකත්වය.
- අතිකාල සහ බැහැරසේවා සඳහා ගෙවීම.

**අයදුම්පත් යොමු කිරීම:-**
ඔබගේ විස්තරාත්මක ජීව දත්ත තොරතුරු, ඥාතීන් නොවන නිර්දේශකයින් දෙදෙනෙකුගේ විස්තර (නම, ලිපිනයන්, දුරකථන අංක) ද සහිතව අදාළ සහතිකපත් වල පිටපත් සමගින්, අධ්‍යක්ෂ (මානව සම්පත්), ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය, කාර්මික ජනපදය, ඒකල, ජා ඇල යන ලිපිනයට **2024 අප්‍රියෙල් 01** දිනට පෙර ලියාපදිංචි තැපැලෙන් **යොමු කරන්න.** නැතහොත් ආයතනයට පැමිණ බාර දීමට කටයුතු කරන්න.
අයදුම් කරනු ලබන තනතුර ලියුම් කවරයේ ඉහළ කොටසේ වම් කෙළවරේ සඳහන් කරන්න.
**මෙම බඳවා ගැනීම් මාස තුනක කාලයක් සඳහා පමණක් වන බව සලකන්න.**

**අධ්‍යක්ෂ ජෙනරාල්,**
**ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය**
**2බී/17බී, කාර්මික ජනපදය,**
**ඒකල , ජා ඇල.**

**දු.ක. - 0113 500 015, 0112 236 283, 0112 236 384, 0112 236 307**
**ෆැක්ස් - 0112 236 434**
විද්‍යුත් ලිපිනය - careers@nerdc.lk වෙබ් පිටුව- **WWW.NERDC.LK**